සිරිකුමාර-,එච්.කේ. සන්ධ්‍යා කාන්ති

*Poster*

# ළමා සුබසාධනය උදෙසා රාජ්‍ය අංශයේ දායකත්වය. (පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ඇසුරින්)

ළමුන්ට යහපත් දේශයක් ගොඩනැගීමේ අරමුණ සාක්ෂාත් කරගනු වස් අද සමාජයේ ළමා සුබසාධනය යන්න බොහෝ දෙනා අතරත් බලයට පත්වන සෑම රජයකමත් අවධානයට යොමු වී ඇත. විවිධ ළමා සුභසාධන සේවාවන් වර්තමානයේ දක්නට ලැබේ. එහෙත් එම සුබසාධන කාර්යයන්වල මතුපිටින් හුවාදක්වන ගුණාත්මක බව අභ්‍යන්තරයේ තිබෙනවා ද යන්න සැක සහිතය. ළමා හිංසනයට ලක් වූවන් පමණක් නොව, එසේ වීමට අවදානමක් ඇති ළමයින් ඉන් මුදවා ගැනීම පවතින රජයේ මෙන්ම සියලු වැඩිහිටි පරම්පරාවේ යුතුකමක් හා වගකීමකි. එබැවින් ළමා සුභසාධනය උදෙසා රාජ්‍ය අංශයෙන් කොපමණ දායකත්වයක් ලබා දෙන්නේ ද යන්න හා එය දරුවන් සඳහා ප්‍රමාණවත් ද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය.

මෙම මූලික අරමුණ ඔස්සේ තවත් විශේෂ අරමුණු කිහිපයක් කෙරෙහිද අවධානය යොමුකෙරිණි. එතුළින්, ළමා සුබසාධනය යනු කුමක්දැයි හඳුනාගැනීම, ළමා සුබසාධනය උදෙසා කටයුතු කරන රාජ්‍ය ආයතන මොනවාදැයි හඳුනා ගැනීම, එම ආයතනවලින් සිදු කරනු ලබන වැඩසටහන් මොනවාද ඒවායින් ළමයින්ගේ අභිවෘධිය උදෙසා කුමන ආකාරයේ දායකත්වයක් සිදුවන්නේදැයි තක්සේරු කර ගැනීම මෙන්ම දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වැඩසටහන් වල ඵලදායිතාවය විමසා බැලීමට හැකි විය.

ඒ අනුව ළමා සුබසාධනය උදෙසා රාජ්‍ය අංශය තුළින් ප්‍රමාණාත්මක දායකත්වයක් සිදුවේද? යන ගැටලුවට සාධාරණ පිළිතුරක් ලබා දීමේ අරමුණින්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් සිදු කරන සුබසාධන වැඩසටහන් ළමුන්ට ප්‍රමාණවත් ද යන්න විමසාබැලීමක් මූලික වශයෙන් සිදු කරන ලදි .එහිදි පර්යේෂණ ක්‍රමවේදයන් භවිතා කරමින් ප්‍රාථමික හා ද්විතීක දත්ත උපයෝගී කරගනිමින් කරුණු රැස්කර විශ්ලේෂණය කරන ලදී. ප්‍රාථමික දත්ත ලබා ගැනීමේදි සරල සසම්භාවි නියදි ක්‍රමය භාවිතා කළ අතර සුබසාධනයට භාජනය වු ළමුන් විසිදෙනෙකුගෙන් සම්මුඛ සාකච්ඡා ආකෘතියට අදාළ දත්ත ලබා ගන්නා ලදී.

මෙම පර්යේෂණය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ කෑගලු දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන ළමා නිවාසයක් තෝරා ගනු ලැබූ අතර, එහිදී ලබාගත් තොරතුරු අනුව පෙනීගියේ රාජ්‍ය අංශයේ ආයතන මඟින් ළමා සුබසාධනය උදෙසා ප්‍රමාණවත් දායකත්වයක් සිදුවන බව අවසන් නිගමනය වශයෙන් ගත හැකි බවකි.

**මූල පද:** **ළමයා, සුබසාධනය**